දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව
කොළඹ දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 අගෝස්තු 01 දින ද සභාවට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| i. | 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගලි බවුසර් සේවා ආදායම ආදායම් ලේඛනය අනුව රු.830,545 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.3,139,738 ක් වුයෙන් ගලි බවුසර් ණයගැතියන් රු.2,309,193 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2019 අවසන් ගිණුම් වලදි නිවැරදි කරනු ඇත. |
| ii. | සමාලෝචිත වර්ෂයේ කසළ බැහැර කිරීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට රු.56,707,126 ක් ගෙවා තිබුණද මූල්‍ය ප්‍රකාශනවල වියදම ලෙස රු.64,129,940 ක් දක්වා තිබීමෙන් වියදම රු.7,422,814 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | පිළිගනිමි. ඉදිරියට නිවැරදි ලෙස ණයහිමි ප්‍රතිපාදන වෙන් කිරීමට සටහන් කරගන්නා ලදී. |

| | | | |
|---|---|---|---|
| iii. | සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු පලාත් සභා ආධාර ණයගැති වටිනාකම රු.2,309,193 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල වටිනාකමක් දක්වා නොමැති වීමෙන් ජංගම වත්කම් රු.2,309,193 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | වැරදීමකින් පලාත් සභා ආධාර ණයගැති ශේෂයට එකතු වීම නිසා මෙම වරද සිදු වී ඇත. 2019 අවසන් ගිණුම් වලදී නිවැරදි කරනු ඇත. |
| iv. | 2018 දෙසැම්බර් 31 දිනට වැටුප් ප්‍රතිපූර්ණ ණයගැති ශේෂය රු.133,520,842 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව වැටුප් ප්‍රතිපූර්ණ ණයගැති ශේෂය රු.151,776,950 ක් වුයෙන් ජංගම වත්කම් රු.18,256,108 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | 2017 වර්ෂයේ හිඟ වැටුප් ප්‍රතිපූර්ණ ලැබීම ගිණුම්ගත කිරීම වැරදීමකින් සටහන මාරු වීම නිසා 2019 අවසන් ගිණුම් වලදී නිවැරදි කරනු ඇත. |
| v. | මූල්‍ය ප්‍රකාශන සඳහා ණයහිමි ප්‍රතිපාදන සැලසීමේදී ගෙවිය යුතු පාර්ශව හා ගෙවිය යුතු මුදල කොපමණද යන්න හඳුනා ගැනීමෙන් තොරව ගිණුම්ගත කිරීම නිසා (පෙර වර්ෂවලදිත්) සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට රු.5,439,034 ක හර කිරීම් හා රු.34,306,975 ක බැර කිරීම් සිදුකර තිබුණි. | ගෙවිය යුතු පාර්ශව හා ගෙවිය යුතු මුදල කොපමණද යන්න නිශ්චිතව හඳුනා ගැනිමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. 2019 අවසන් ගිණුම් වලදි නිවැරදි කරනු ඇත. |
| vi. | පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා ගෙවන ලද රු.2,990,543 ක මුදල පරිගණක මෘදුකාංග යටතේ ගිණුම්ගත වී නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. | මෙම අත්හැරුණු පරිගණක මෘදුකාංග වියදම 2019 ගිණුම් වලදි නිවැරදි කරනු ඇත. |
| vii. | 2015 හා 2012 වර්ෂවල පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 4 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග වත්කම් ගිණුම්ගත කල යුතුවේ. | 2012 හා 2015 වර්ෂ වල පරිත්‍යාග ලෙස ලැබුණු වාහන 04 හි වටිනාකම සොයාගැනිමට නොහැකි වු බැවින් ගිණුම් ගත කල නොහැකි විය. 2019 ගිණුම් වලදී නිවැරදි කරනු ඇත. |

**(ආ) අසම්භාව්‍ය බැරකම්**

| | | |
|---|---|---|
| කසළ ඉවත් කිරීම වෙනුවෙන් බර්න්ස් සමාගම විසින් සභාවට එරෙහිව පවරා තිබූ නඩුව සඳහා දුන් තීරණය පරිදි සභාව විසින් රු.20,958,780 ක් හා ගාස්තු වශයෙන් රු.300,000 ක මුදලක් ගෙවිය යුතු විය.මෙම තීරණයට විරුද්ධව සභාව විසින් වානිජ මණ්ඩලයේ පැවරු නඩු තීරණයද සභාවට අවාසිදායක ලෙස ලබා දී තිබුණි. එමෙන්ම වර්තමානයේ සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති විභාග වෙමින් පවතින නඩු සඳහා රු.1,506,333 ක වියදමක් දරා තිබුණි. | සභාවට වාසිදායක පරිදි කටයුතු කරගැනිම සුදුසු වේ. | රු.1,506,333 ක මුදලක් ගෙවා ඇත්තේ නඩු 4 ක් සඳහාය.මෙම නඩුව මේ වන විටත් අවසන් වි නොමැති අතර කරුණු තහවුරු කිරිම සඳහා 2019.07.18 වන දින කැඳවිමට නියමිතය. |

(ඇ) **නොසැසඳුනු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| i. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 14 කට අදාල ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන / වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.871,329 ක් අඩුවෙන් හා රු.85,277,399 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 ගිණුම් සකස් කිරිමේදි සොයාබලා නිවැරදි කරනු ඇත. |
| ii. | මූල්‍ය ප්‍රකාශන අනුව **LLDF** ණයහිමියන් ලෙස රු.1,320,538 ක ශේෂයක් දක්වා තිබුණද ලෙජර් ගිණුම් අනුව ශේෂය රු. 897,946 ක් වූයෙන් රු.422,592 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසදා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් වලදි නිවැරදි කරනු ඇත. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| i. | 2002 සිට 2018 වර්ෂය දක්වා ආදායම ලෙස ලබාගෙන තිබූ රු.562,786 ක් වටිනා චෙක්පත් 20 ක් අගරු වී තිබූ නමුත් ඒ සඳහා මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අගරු චෙක්පත් සඳහා නොපමාව මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| ii. | 2008 සිට 2016 දක්වා කාල පරිච්ඡේදයට අදාලව ආයතන 11 කින් අයවිය යුතු ගලිබවුසර් ආදායම රු.65,545 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අයකර ගැනීමට කටයුතු සිදු කරන බව දන්වමි. |
| iii. | 2006 හා 2007 කාලපරිච්ඡේදයට අදාල රු.121,456 ක් වූ නොපියවූ දේපල ණය පොලී අත්තිකාරම් ශේෂය ඇතුළුව 2018 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු රු.2,230,599 ක් වූ මුළු මුදල පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේපල ණය පොලී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉතිරි මුදල ප්‍රතිපූර්ණය කිරිම සඳහා මූලික කටයුතු සිදුකර ඇත. |
| iv. | රත්මලාන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් මිස්ට ක්ලීන් එන්වයර්මන්ට් ආයතනයෙන් 2017 වසරේ සිට අයවිය යුතු රු.82,425 ක මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| i. | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,618,278 ක් වූ ගිණුම් විෂයයන් 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ශේෂ තහවුරු කර ගැනිම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කල යුතුවේ. | නිවරදි කිරිමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| ii. | 2014 ජනවාරි 21 දිනැති අංක 1846/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පලකළ නිවේදනය අනුව සභිකයන්ට මාසිකව රු.6,500 ක් ගමන් වියදම් වශයෙන් ප්‍රතිපූර්ණය කළ හැකි වුවත් සභිකයන් 46 ක් සඳහා 2018 වර්ෂයේ අප්‍රේල් සිට සැප්තැම්බර් දක්වා රු.1,794,000 ක මුදලක් ගමන් වියදම් විස්තර නොමැතිව ගෙවා තිබුණි. | ගෙවීම් සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි ආකෘතිය භාවිතා කරන ලෙස මන්ත්‍රීවරුන් දැනුවත් කරන බව දන්වමි. |
| iii. | 2012 ජුලි 05 දිනැති මහා සභාවේ 08(02) අ.67 සභා සම්මුතිය අනුව දුරකථන ඇමතුම් ගාස්තු මාසිකව රු.6,000 ක උපරිමයට යටත්ව ගෙවීම් කලහැකි වුවත් සභිකයකු සඳහා රු.35,066 ක් බිල්පත් ඉදිරිපත් නොකර මාසික දීමනාවක් වශයෙන් ගෙවා තිබුණි. | ගෙවීම් සඳහා අදාල සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | බිල්පත ඉදිරිපත් කරන ලෙස අදාළ මන්ත්‍රීතුමියට ලිඛිතව දැනුම් දි ඇත. ලැබුණු විගසම විගණනයට ඉදිරිපත් කරමි. |

**1.3 අනුකූල නොවීම**

14.1 **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 218 හා 286 (අ) වගන්ති | සභාවේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් සහ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 218 හා 286 (අ) වගන්ති අනුව කටයුතු කල යුතුවේ. | වාර්ථාව සකස් කරමින් පවති. ඉතා ඉක්මනින් ඉදිරිපත් කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු.රෙ.110 | හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | මු.රෙ.110 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | හානි හා පාඩු ලේඛනයක් ඉදිරියේදි පවත්වාගෙන යාමට කටයුතු සිදුකරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මු.රෙ. 188 (2) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ රු.59,234 ක් වටිනා චෙක්පත් 7 ක් හා මුදල් ඇණවුම් 2 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 188 (2) අනුව කටයුතු කල යුතුවේ. | රු.54234 සම්බන්ධයෙන් ඉදිරියේදි කටයුතු සිදුකරන බව දන්වමි. |
| iii. | මු.රෙ. 571 | වර්ෂ 2 ක ඉක්ම වූ තැන්පතු රු.16,525,237 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | වර්ෂ 02 ඉක්මවූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු සිදුකරන බව දන්වමි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 ඡේදය | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරික්ෂාව සිදුකර නොතිබුණි. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3:1 ඡේදය අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි ඉඩකඩ ඇති පරිදි වාහන වල ඉන්ධන දැවීම පරික්ෂා කිරීමට උපදෙස් ලබා දි ඇත. |

(ඈ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 2019 වර්ෂයේ පරිගණක හා මෘදුකාංග සඳහා වෙනමම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.299,585,345 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.341,690,299 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | | |
|---|---|---|
| බැංකු සැසඳුම් සකස් කිරීමේදී සෘජු බැර නිසි පරිදි හඳුනාගැනීමෙන් තොරව දිගින් දිගටම පැවතීම නිසා මුදල් පොතට අනුව අවාසිදායක ශේෂයක් පැවතුණි. | සෘජු බැර අදාල මාසයේ නිසි පරිදි හඳුනාගත යුතුවේ. | දැනට බැංකු සැසඳුම් සකස් කිරීමේදී ඊලඟ මාසයේදිම සෘජු බැර හා සෘජු හර හඳුනාගෙන ගිණුම්ගත කිරීම සිදුකරනු ලබයි. ඉදිරියේදි මෙම වැරදි නිවැරදි කරන බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| වරිපනම් හා බදු | 424,300 | 400,112 | 375,515 | 368,936 | 365,100 | 686,095 | 243,364 | 343,178 |
| කුලී | 19,035 | 16,217 | 12,638 | 16,548 | 29,747 | 27,975 | 10,862 | 15,285 |
| බලපත්‍ර ගාස්තු | 23,500 | 45,731 | 16,895 | 86,815 | 34,235 | 94,318 | 18,893 | 62,782 |
| වෙනත් ආදායම් | 300,000 | - | 184,543 | 514,918 | 433,815 | 355,995 | 320,332 | 173,227 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) වරිපනම් | | |
| i. සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් බදු ආදායම රු.354,286,573 ක් වුවද ඉන් රු.108,714,624 ක් හෙවත් සියයට 31 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | බිල් කරන ලද වරිපනම් බදු වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | සියළුම දේපල සඳහා වරිපනම් බදු ගෙවීම් කිරිමේදි සමහර දේපල සඳහා ප්‍රමාද වි ගෙවීම් කරනු ලබන අතර, වරිපනම් නොගෙවා ඇති දේපල සඳහා රතු නිවේදන නිකුත් කර එම බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ |
| ii. 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.337,835,697 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.93,113,598 ක් හෙවත් සියයට 31 ක් අයකරගෙන තිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ වරිපනම් බදු එකතු කිරිමේ කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති විම නිසා ද එම කටයුතු ප්‍රමාද විමට බලපා ඇත. හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රමවේදයක් දැනටමත් සකස් කරමින් පවති. |

| | | | |
|---|---|---|---|
| iii. | සමාලෝචිත වර්ෂය තුලදී දේපල 193 ක් සඳහා රතු නිවේදන නිකුත් කර රු.63,705,107 ක හිඟ වරිපනම් බදු මුදලක් අයකර ගැනීමට අපේක්ෂා කලද රු.18,164,908 ක මුදලක් හෙවත් සියයට 29 ක් අයකර ගෙන තිබූ අතර රතු නිවේදන ලබා දී තිබූ වරිපනම් ඒකක 126 කින් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ වරිපනම් බදු ඇති දේපල සඳහා රතු නිවේදන නිකුත් කර දේපල තහනමට ගන්නා බවට නිවේදනය කර ඉන්පසු දේපල තහනමට ලක්කර එමගින් හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| iv. | වරිපනම් බදු අය කරගැනීම සඳහා රතු නිවේදන ලබා දීමේදී දේපල 56 ක් ක්ෂේත්‍ර පරීක්ෂාවේදී හඳුනාගත නොහැකි වූ අතර එමගින් අයවිය යුතු හිඟ මුදල රු.11,569,092 ක් විය. | දේපල නිශ්චිතව හඳුනාගෙන බිල් කිරීමට කටයුතු කල යුතුවේ. | ක්ෂේත්‍ර පරික්ෂාවේදි හඳුනා ගැනිමට නොහැකි වු දේපල පිළිබඳව තවදුරටත් පරික්ෂා කිරිම සඳහා තක්සේරු පරික්ෂක අංශය වෙත යොමු කර ඇති අතර ඔවුන්ගේ වාර්තාව ලැබුණ පසුව ඉදිරියට ගතයුතු ක්‍රියාමාර්ගය පිළිබඳව සලකා බලනු ලැබේ. |
| v. | 2018 දෙසැම්බර් 31 දින වන විට වරිපනම් බදු අයකල හැකි දේපල 84013 ක් පැවති අතර ඉන් දේපල 39609 කින් රු.345,923,440 ක වරිපනම් බදු හිඟයක් පැවතුණි.ඉන් රු.100,000 ක් ඉක්ම වු වරිපනම් ඒකක 424 කින් රු.131,926,030 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු ආදායම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හඳුනාගැනිමට නොහැකි වු දේපල පිළිබඳව ආදායම් පරික්ෂක නිලධාරින් හා තක්සේරු පරික්ෂක නිලධාරින් විසින් පරික්ෂා කිරිම කරනු ලබන අතර ඉතිරි වන දේපල සඳහා රතු නිවේදන නිකුත් කර හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| vi. | රු.50,000 ත් රු.100,000 ත් අතර වටිනාකමකින් යුත් වරිපනම් ඒකක 617 කින් රු.43,373,869 ක මුදලක් අයවීමට තිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගත යුතුවේ. | රු.100000 ට වැඩි වටිනාකමින් යුත් දේපල අතරට නගර සභා දේපලද ඇතුලත් වි ඇති අතර එම දේපල වල හිඟ වරිපනම් එම ලේඛනයෙන් ඉවත් කිරීමට අනුමැතිය ලබාගැනිම සඳහා මුදල් කාරක සභාව වෙත යොමු කර ඇත. |
| vii. | කොට්ඨාශ 28 න් වැඩිම හිඟ මුදල වු රු.48,431,364 ක් රත්මලාන නැගෙනහිර කොට්ඨාශයෙන් අයකර ගත යුතුව පැවති අතර එහි හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා දේපල තහනම් කිරීමේ නිලධාරියකු යොදවා නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | කොට්ඨාශ අංක 28 සඳහා දේපල තහනම් කිරිමේ නිලධාරියකු පත් කර ඇති අතර මේ වන විට ඔහු විසින් හිඟ වරිපනම් බදු එකතු කිරිමේ කටයුතු කරමින් සිටි. |

(ආ) කසළ බදු

--------

| | | | |
|---|---|---|---|
| i. | සභාව විසින් කසළ ඉවත්කරනු ලබන ව්‍යාපාරික ස්ථාන සමඟ ගිවිසුම්ගත වී නොමැති බැවින් හිඟ කසළ ගාස්තු අයකිරීමේදී නීත්‍යානුකූලව කටයුතු කල නොහැකිව තිබූ අතර 2003 නොවැම්බර් 18 දිනැති අංක 08(10)35 දරන සභා තීරණය හා මුදල් කාරක සභාවේ උපදෙස් පරිදි හිඟ කසළ ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීම නිසා 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කසළ ආදායම රු.9,542,119 ක් විය. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | සෞඛ්‍ය පරිපාලකවරුන්ට හිඟ කසළ ලැයිස්තු ලබා දී මසක් ඇතුලත අයකර ගැනීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇත. |
| ii. | 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කසළ ආදායම රු.9,768,276 ක් වු අතර ඉන් අයකරගත නොහැකි රු.4,232,299 ක් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි. | හිඟ ශේෂයන් ඇති නොවන පරිදි වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පවතින ගිණුම් ක්‍රමය අනුව ආරම්භක ශේෂයෙන් ලැබිම් හැර ඉතිරි හිඟ සමුච්චිත අරමුදලට ගලපා 2018.12.31 දිනට හිඟය නැවත ගිණුම්ගත කර ඇත. |
| iii. | පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද හිඟ ශේෂයන් පැවති ආයතන 155 කට සමාලෝචිත වර්ෂයේදී අදාල සේවාව ලබා දී තිබුණද හිඟ ගෙවීම් හෝ වර්ෂයට අදාල මුදල් හෝ අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා ඊට අදාල හිඟ ශේෂය රු.5,709,325 දක්වා වැඩි වී තිබුණි. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කල යුතු අතර ගාස්තු නොගෙවන ආයතන සඳහා සේවාව ලබා නොදිය යුතුවේ. | හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) විනෝද බදු (සිනමාශාලා)

--------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී රු.5,033,376 ක ආදායමක් ලැබී තිබුණද 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය වු රු.154,302 ක මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිලිතුරු ඉදිරිපත් කර නොමැත. |

(ඈ) වෙනත් බදු

------------

| | | |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කේබල් ටී.වී. අදායම රු.4,114,151 ක්, විශේෂ ප්‍රචාරක දැන්වීම් හිඟ ශේෂය රු.6,202,810 ක් හා විශේෂ ප්‍රචාරක දැන්වීම් (වීථි නාම පුවරු) හිඟ ශේෂය | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

රු.3,000,000 ක ප්‍රමාණයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 **කුලී**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) කඩකුලී | | |
| i. 2018 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ආදායම රු.8,997,060 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබු අතර මාස 03 කට වඩා වැඩි හිඟ කුලියක් පැවති කඩ කාමර 235 ක් තිබුණි. | ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කල යුතුවේ. | 2018.12.31 දිනට හිඟ කඩකුලී 2019.01.31 දිනට පෙර ගෙවීම් කරන ලෙස බදුකරුවන් වෙත දැනුම් දෙන ලදී. එසේ හිඟ කුලී නොගෙවන බදුකරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. |
| ii. 2014 වර්ෂයේ සිට පැවති මස්කඩ කුලී හිඟ ශේෂය වු රු.2,471,517 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මිශ්‍ර ආදායම් අංශයේ ලෙජරයක් තුල එවැනි ඉදිරියට ගෙන ආ ශේෂයක් නොමැති බවට ලෙජරයන් නිරික්ෂණය කිරීමේදි පෙනී යන ලදී. |
| (ආ) දේපල කුලියට දීම (බදුකර) | | |
| i. ඇස්තමේන්තුගත ආදායම රු.1,400,000 ක් වුවද වර්ෂය තුල රු.477,412 ක් අයකර ගෙන තිබුණි. | ඇස්තමේන්තුගත ආදායම උපයා ගැනීමට කටයුතු කල යුතුවේ. | හිඟ ආදායම අයකර ගැනිමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරමින් පවති. |
| ii. 2018 දෙසැම්බර් 31 දිනට දේපල 17 කින් අයවිය යුතු හිඟ කුලිය රු.5,079,510 ක් වු අතර ඉන් දේපල 10 ක හිඟය මාස 03 ඉක්මවා තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2018.12.31 දිනට පැවති හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කරන අතර එසේ නොමැති බදු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනිමේ කටයුතු සිදුකරමින් පවති. |
| 2.3.4 බලපත්‍ර ගාස්තු | | |
| i. සමාලෝචිත වර්ෂය සඳහා බිල්කරන ලද කර්මාන්ත හා ව්‍යාපාර බදු ආදායම රු.35,050,583 ක් වුවද ඉන් රු.28,984,433 ක් හෙවත් සියයට 83 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | බිල් කිරීම් නිවැරදි කර හිඟය අයකර ගැනීමට කටයුතු කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| ii. | 2017 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂය රු.57,729,233 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුලදී රු.2,046,045 ක් හෙවත් සියයට 3.5 ක් අයකරගෙන තිබූ අතර රු.55,683,188 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | අදාල නිවැරදි කිරීම් සිදුකිරීමෙන් පසුව නිවැරදි හිඟ ශේෂය අයකර ගැනීමට අදාල නීති කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වේ. |
| iii. | 2018 වර්ෂය සඳහා බලපත්‍ර නිකුත් කල යුතු වෙළඳසැල් සංඛ්‍යාව 1400 ක් ලෙස හඳුනාගෙන තිබුණද 758 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතුවේ. | සමීක්ෂණයකින් පසුව නිවැරදි වෙළඳසැල් සංඛ්‍යාවෙන් වෙළඳ බලපත්‍ර නිකුත් කර නොමැති වෙළඳසැල් සඳහා ඉදිරියේදී නීති මඟින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සිදුවේ. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

--------------------------

(අ) උසාවි දඩ

---------

| | | | |
|---|---|---|---|
| i. | ඇස්තමේන්තුගත ආදායම රු.20,000,000 ක් වුවද වර්ෂය තුල ලැබුණු උසාවි දඩ ආදායම රු.4,543,325 ක් විය. | ඇස්තමේන්තුගත ආදායම උපයා ගැනීමට කටයුතු කල යුතුවේ. | උසාවි දඩ ආදායම අයකර ගැනීම සඳහා දැනට උපලේඛන සකස් කරමින් පවති. |
| ii. | ආහාර පනත යටතේ 2018 වසරේ පවරා තිබූ කිසිදු නඩුවක් සඳහා දඩ ආදායම් ලැබී නොතිබුණි. 2017 වර්ෂයේ පවරා තිබූ නඩු 26 ක් සඳහා රු.277,125 ක දඩ ආදායමක් නගර සභාවට අයත් බව ගල්කිස්ස උසාවිය මගින් දන්වා තිබුණද එම මුදල් සභාව වෙත ලබා ගැනීමට 2018 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | දඩ ආදායම් නොපමාව අයකරගත යුතුවේ. | මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා මෙම මුදල් අයකර ගැනීමට කටයුතු සලසා ඇත. |
| iii. | 2014 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාල උසාවි දඩ හිඟ ආදායම රු.127,646,752 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2017 වර්ෂයට පෙර උසාවි දඩ මුදල් තොරතුරු සටහන් කිරීමට සභාවේ නිලධාරීන් හට අධිකරණයෙන් අවසර නොලැබීම හේතුවෙන් එම කාල වකවානුවට අදාල දඩ මුදල් අයකර ගැනීමට නොහැකි වුවත් 2017 න් පසු අධිකරණය අපගේ නිලධාරීන් යවා පිළියෙල කරන ලද උපලේඛන මඟින් උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| බස්නාහිර පලාත් සභාවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු. 387,271,620 ක් විය. | වර්ෂයට අදාල මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මුද්දර ගාස්තු උපලේඛන සකස් කරමින් පවතින නිසා අදාල මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමින් පවති. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1. **කාර්ය සාධනය**

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| සභාව විසින් ඉටු කළ යුතුව තිබූ කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | සකස් කරමින් පවති. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | | |
| --- | --- | --- |
| මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මහා මාර්ගයක් ඉදිකිරීමට ඉඩම් අත්පත් කර ගනිමින් සිටියදී දෙහිවල ෆෙයාලයින් පාරේ ධීවර නිවාස අසල අත්පන්දු ක්‍රීඩාපිටිය ඉදිකිරීම වෙනුවෙන් දරන ලද රු.284,477 ක වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | සභා අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කල යුතුවේ. | අවශ්‍යා අවස්ථාවේ දි ඉවත් කිරීමට කටයුතු කරමි. |

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදය

| | | |
| --- | --- | --- |
| පොදු අරමුදලින් ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘති 48 න් ව්‍යාපෘති 41 ක වැඩ ආරම්භ කිරීමට ගිවිසුම්ගත වී තිබුණේ වර්ෂයේ අවසන් දින කිහිපය තුල බැවින් ව්‍යාපෘති නිම කිරීමට නොහැකි වී තිබූ අතර ව්‍යාපෘති 02 ක් සඳහා 2019 මාර්තු 01 දින වන විටත් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි. | ව්‍යාපෘති කාලීනව ඉටු කිරීමට කටයුතු කල යුතුවේ. | ව්‍යාපෘති ඉටුකිරිමේදි ව්‍යාපෘති යෝජනා ලැබු දින සිට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සහ ගිවිසුම්ගතවීම දක්වා කාල සීමාව අවම වශයෙන් මාස 04 ක් පමණ වන බැවින් කෙසේ හෝ මෙම ව්‍යාපෘති ඉටු කිරීමට 2018 වර්ෂයේ ගිවිසුම් ගතවූ අතර ඒ සඳහා ප්‍රතිපාදන විවිධ ණයහිමියන් යටතේ 2019 වර්ෂයට ගෙන යන ලදී. |

(ඇ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| 2018 වර්ෂය තුල මහා නගර සභා බල ප්‍රදේශයේ වෙන් නොකරන ලද කසළ ටොන් 30885 ක් වූ අතර කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු. 23,163,750 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය කල යුතුවේ. | වෙන් නොකරන ලද කසළ තුල මිශ්‍ර කසළ සහ වෙන් නොකරන ලද කසළ යන කසළ වර්ග 02 ම ඇතුළත් නිසා එය විධිමත් අයුරින් සිදු වී නොමැත. 2019 වර්ෂයේ සිට එය විධිමත් අයුරින් සිදු කිරීමට කටයුතු කර ඇත. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) **සැලසුම් අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- | --- |
| i. | ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වූ සැලසුම් අනුමත කිරීමේදී එම ගොඩනැගිලි ඉදිකරන බිම් කට්ටි අනුමත නොකර ගොඩනැගිලි සැලසුම් පමණක් අනුමත කල අවස්ථා 34 ක් පැවතුණි. | සැලසුම් අනුමත කිරීමේදී බිම් කට්ටි අනුමත කර තිබේද යන්න තහවුරු කල යුතුවේ. | ගොඩනැගිලි ඉදිකිරීමේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සමහර ලිපිගොනු සඳහා 1986 මාර්තු මසට පෙර එනම් නාගරික සංවර්ධන අධිකාරියේ පනත ක්‍රියාත්මක කිරීමට පෙර අනු බෙදුම් කර ඇති බිම්කට්ටි සැලසුම් ඉදිරිපත් කරයි. නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව එම අනුබෙදුම් අනුමත කිරීමට අවශ්‍යතාවයක් නැත. |
| ii. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි 2008-2020 හි 14(1) අ වන උපවගන්තිය අනුව සැලසුම් අනුමත කිරීම සති 08 ක් ඇතුළත කල යුතු වුවත් බිම් කට්ටි සැලසුම් අවස්ථා 45 ක දින 115 සිට 380 ක කාල පරාසයක් සහ ගොඩනැගිලි සැලසුම් 22 කට දින 141 සිට 360 ක කාල පරාසයක් ගත වී තිබුණි. | ප්‍රමාද කාලය අවම කිරීමට කටයුතු යුතුවේ. | මෙම ලිපිගොනු සැලසුම් කමිටුව විසින් අඩුපාඩු පෙන්වා දී ඇති ලිපිගොනු වේ. සමහර ලිපිගොනු වල සංශෝධනයන් අයදුම්කරු විසින් සිදුකර නොමැති අතර සමහර ආයතන වලින් නිරවුල් සහතික ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන්ද මෙම අයදුම්පත් අනුමත කිරීම ප්‍රමාද වි ඇත. |

| | | | |
|---|---|---|---|
| iii. | නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව මහල් 04 ක් සහ ඒකක 12 කින් යුත් සාහාධිපත්‍ය ගොඩනැගිල්ලක් (condominium) සඳහා මාර්ගයේ අවම පළල අඩි 19.5 ක් (මීටර් 06 ) විය යුතු වුවත් නගර සභා මාවතේ පිහිටි මාර්ගයේ පළල අඩි 10 ක් විය. | නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි අනුව කටයුතු කල යුතුවේ. | සැලසුම් කමිටුවෙන් සාකච්ජා කර අනුමැතිය ලබා දී ඇත. |
| iv | ඉල්ලුම් කරන ලද අනුකූලතා සහතික හා නිකුත් කරන ලද අනුකූලතා සහතික පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් නඩත්තු කර නොතිබුණු බැවින් ඉල්ලුම් කරන ලද අනුකූලතා සහතික අප්‍රමාදව නිකුත් කල බව තහවුරු කර ගත නොහැකි විය. සමාලෝචිත වර්ෂය තුළ අනුකූලතා සහතික 295 ක් සඳහා ඉල්ලුම් කලද ඉන් 176 ක් නිකුත් කර තිබුණි. එමෙන්ම ඉල්ලුම් කරන ලද අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා මාස 06 කට අධික කාලයක් ගත වී තිබූ අවස්ථා පැවතුණි. | අනුකූලතා සහතික අප්‍රමාදව නිකුත් කල යුතුවේ. | අනුකූලතා සහතික නිකුත් කිරීමට ලේඛනයක් පවත්වාගෙන යන බවත් අයදුම් පත්වල පවතින අඩුපාඩු නිසා මෙවැනි තත්ත්වයක් ඇතිවේ. |

3.3. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 230 ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 02 ක් විය. | පුරප්පාඩු පිරවීම සඳහා බඳවාගැනීම සිදු කල යුතුවේ. | පුරප්පාඩු පිරවීමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල නිත්‍ය රාජකාරියෙන් බැහැරව වෙනත් රාජකාරි වල සේවයේ යෙදවූ සේවකයන් 58 දෙනෙකු විය. | නිත්‍ය තනතුරු වල සේවකයින් යෙදවිය යුතුවේ. | දැනට අනුමත කාර්යමණ්ඩලයේ පවතින තනතුරු බොහෝමයක් වර්තමාන සේවා අවශ්‍යතාවයන් ප්‍රමාණවත් නොවන අතර රියදුරු තනතුරු හා පරිපාලක තනතුරු දෛනික සේවා සැපයීමේ කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය තනතුරු වන බැවින් සේවා අවශ්‍යතාවය මත කම්කරු සේවකයින් එම තනතුරු වෙත අනුයුක්ත කර රාජකාරි ඉටු කරනු ලබයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබූ මියගිය හා විශ්‍රාම ගිය අයගෙන් අයවිය යුතු සේවක ණය රු.1,277,723 ක් හා මාරු වී ගිය අයගෙන් රු.495,335 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි අංක 22 අනුව කටයුතු නොකිරීම නිසා සභාවේ සේවය කල සේවකයෙකුට 2013 සිට 2015 දක්වා වැටුප් වර්ධක ලබා දී වැටුප් සංශෝධනය කර හිඟ වැටුප් ලබාදීමට පියවරගෙන නොතිබූ අතර 2015 වර්ෂයේදී විධිමත් පරීක්ෂණයකින් තොරව වැඩ තහනම් කර තිබුණි. 2016.12.21 දින සිට අනිවාර්ය නිවාඩු ගන්වා 2018.08.17 දින සිට නැවත සේවයේ පිහිටුවා තිබුණද 2019 අප්‍රේල් 30 දින වන විටත් විනය කටයුතු අවසන් කර නොතිබුණි. | විනය පරීක්ෂණය ප්‍රමාදයකින් තොරව පැවැත්විය යුතු අතර ඒ අනුව වැටුප් සංශෝධනය පිළිබඳ සලකා බැලිය යුතුවේ. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වෙන බැවින් ඔහුගේ ඉල්ලීම පිළිබඳව සලකා බලනු ඇත. |
| (ඉ) | සභා බල ප්‍රදේශයේ ස්ථාන 27 ක රාජකාරී සඳහා යොදවා සිටි සේවකයන් 95 දෙනෙකු එම ස්ථාන වල නොසිටීම සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සේවක අධීක්ෂණය හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදය විධිමත් කල යුතුවේ. | අතිකාල දීමනා ලබා නොදීම නොපැමිණි දිනයක් ලෙස සලකා දිනක වැටුප කපා හැරීම සහ මෙවැනි සිද්ධීන් අවම කර ගනිමින් කටයුතු කිරීමට උපදෙස් දී ඇත. |
| (ඊ) | දීර්ඝ කාලයක සිට ප්‍රධාන පුස්තකාලයාධිපති විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩුවක් පැවති අතර වර්තමානයේදී එම තනතුරේ පුස්තකාලයාධිපති III ශ්‍රේණියේ නිලධාරිනියක් රාජකාරී කටයුතු කරමින් තිබුණි. | පුස්තකාලයාධිපති විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩුව පිරවීමට කටයුතු කල යුතුවේ. | පුස්තකාලාධිපති විශේෂ ශ්‍රේණිය තනතුර 2013.01.01 දින නව කාර්යමණ්ඩල අනුමැතිය ලැබීමේදී අලුතින් ඇතිවූ තනතුරක් වන අතර මෙම තනතුරෙහි පත්වීම් බලධාරියා වන්නේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන බැවින් එකී පුරප්පාඩුව පිළිබඳව ලිපි මගින් සහ අදාළ ආකෘති මගින් විටින් විට බලධාරි ආයතන දැනුවත් කර ඇත. |

## 3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| | **වෙළඳ ස්ථාන කුලී** | | |
| (අ) | සභාව සතු කඩ කාමර 371 කින් 286 ක කුලී හිඟව පැවතුන අතර බොහෝ කඩ කාමර බදු දී තිබුණද බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එමෙන්ම සමහර ගිවිසුම්වල ගිවිසුම්ගත කාලය ඉක්ම ගොස් තිබුණද නැවත ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු දීමේදී ගිවිසුම්ගත විය යුතු අතර නියමිත කාල සීමාවෙන් පසු ගිවිසුම් අලුත් කල යුතුවේ. | සභා සම්මුතිය අනුව ගිවිසුම් ගතවීමට කටයුතු සිදු කරමින් පවතී. දැනටමත් බොහෝ ආයතන සමඟ ගිවිසුම් ගතව ඇත. |
| (ආ) | කුලී ගිවිසුම් ප්‍රකාරව අඛණ්ඩව මාස 03 ක කුලී නොගෙවන කඩ හිමියන් 235 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර කඩ හිමියන්ගේ නම් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම කඩ කාමර 32 ක් ව්‍යාපාර කිරීමෙන් තොරව වසා දමා තිබුණි. | කුලී නොගෙවන කඩ හිමියන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු අතර වසා දමා ඇති කඩකාමර බදු දීමට කටයුතු කල යුතුවේ. | නීත්‍යානුකූල ගිවිසුමක් නොමැති නිසා එසේ කල නොහැකි විය. ඉදිරියේදී කටයුතු කිරීමට නිසි ක්‍රමවේදයන් දැනටමත් සකස් කරමින් පවතී. |

## 3.5 <u>වත්කම් කළමනාකරණය</u>

### 3.5.1 <u>වත්කම් ලේඛනගත නොකිරීම.</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි පිළිබද විස්තර අඩංගු ලේඛනයක් ඉඩම් අංශය විසින් නඩත්තු කර තිබුණද එහි සියළු තොරතුරු ඇතුලත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් පවත්වාගෙන යා යුතුවේ. | සභාව සතුව ඇති ලිපිගොනු ඇසුරින් මෙම ලේඛණය සකස් කර ඇති අතර ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් විමසා ඉතිරි තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත. |
| (ආ) | නගර සභාව විසින් නඩත්තු කර තිබූ ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය අනුව දේපල 97 ක් පැවතියද විගණනයට ලබා දී තිබූ තොරතුරු අනුව දේපල 75 ක් පමණ පැවතුණි. | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලිනව පවත්වාගෙන යා යුතුවේ. | සභාව සතුව ඇති ලිපිගොනු ඇසුරින් මෙම ලේඛණය සකස් කර ඇති අතර ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් විමසා ඉතිරි තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත. |

**3.5.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම.**

| | | | |
|---|---|---|---|
| (අ) | සභාව සතු දේපල සඳහා නිසි ආරක්ෂක පියවරයන් නොගැනීම නිසා සභාව සතු ඉඩම් 03 ක් අනවසර පදිංචිකරුවන් භුක්ති විඳිමින් පැවතුණි. | සභාව සතු දේපල සඳහා ආරක්ෂක විධිවිධාන යෙදවිය යුතුවේ. | මේ සම්බන්ධව නීතිමය පියවර ගැනීමට හා ඉදිරියේදී ආරක්ෂක පියවර ගැනීමටත් කටයුතු යොදා ඇත. |
| (ආ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි දේපල 75 න් දේපල 36 ක අයිතිය තහවුරු කිරීම පිළිබඳව අවශ්‍ය ඔප්පු හෝ පවරා ගැනීමේ නියෝග නොතිබුණි. | සභාව සතු දේපල වල අයිතිය තහවුරු කර ගත යුතුවේ. | මේ සම්බන්ධව නීතිමය පියවර ගැනිමට හා ඉදිරියේදී ආරක්ෂක පියවර ගැනීමටත් කටයුතු යොදා ඇත. |
| (ඇ) | සභාව සතු ඉඩම් පිළිබඳව වාර්ෂික වත්කම් සත්‍යාපනයක් දිගු කලක සිට සිදුකර නොතිබුණි. | සභාව සතු ඉඩම් පිළිබඳව වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කල යුතුවේ. | මේ සම්බන්ධව 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. |

**3.5.3 වත්කම් වලින් ලැබිය යුතු ආදායම ලබා නොගැනීම.**

| | | |
|---|---|---|
| ගල්කිස්ස හෝටල් පාරේ රූඩ් 01 පර්චස් 4.1 ක් වූ ඉඩම වාහන නැවතුම් පොලක් ලෙස භාවිතා කිරීම සඳහා ගල්කිස්ස හෝටලය වෙත බදුදීමේදී පැවැති ගිවිසුම්වල අඩුපාඩු හේතුකොට ගෙන 2018 දෙසැම්බර් 31 දින වන විට මෙම දේපලේ හිඟ කුලිය රු.5,116,709 ක් වී තිබුණ අතර එම කුලී බදුකරුගෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නව ගිවිසුමක් ඇතිකර ගැනීමට හෝ සංශෝධනය කර හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | ගිවිසුමේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමේ හැකියාව පිළිබඳ පවතින නීතිමය තත්ත්වය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා යොමුකර ඇති අතර උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. |

**3.5.4 නඩු පැවරූ දේපල**

| | | |
|---|---|---|
| සභාව සතු ෆේසර් මාවතේ පිහිටි ඉඩම 1999 අගෝස්තු 27 දින සිට අනවසරයෙන් භුක්ති විඳින අයගෙන් දේපල සන්තකය නැවත ලබා ගැනීම සඳහා එම ආයතනයට විරුද්ධව නඩු පවරා තිබුණි. | සභාව සතු දේපල වල ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කල යුතුවේ. | තීන්දුව අනුව 2019.10.25 වන දින ලිඛිත දේශනයකට කැඳවා ඇත. |

### 3.5.5 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වසා දමා හා මුද්‍රා තබා තිබූ කඩ කාමර 32 ක් නැවත පවරා ගෙන වෙනත් බදුකරුවන් වෙත බදු දී ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් ඉපයීමට කටයුතු කල යුතුවේ. | මේ වන විට වාස බද්ද අහෝසි කර මුද්‍රා තැබීමට කටයුතු කරමින් පවතී. |

### 3.5.6 වාර්ෂික භාණ්ඩ /තොග සමීක්ෂණ

| | | |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කල යුතුවේ. | ඉතා ඉක්මනින් ඉදිරිපත් කරමි. |

### 3.5.7 වාහන උපයෝජනය

| | | |
|---|---|---|
| (අ) වාහන 12 ක් ගර්හිත තත්ත්වයේ පැවති අතර ඉන් සමහර වාහන දිගුකාලයක සිට භාවිතා කර නොතිබුණි. | ගර්හිත වාහන සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුවේ. | සභාවේ භාවිතයෙන් ඉවත් කරන ලද වාහන නඩත්තු කර ධාවනයේ යෙදවීම ඵලදායි නොවන විට වාහන හා යන්ත්‍ර සූත්‍ර අපහරණය සිදු කරනු ලබයි. ඒ අනුව සඳහන් කර ඇති වාහන 12 ද ටෙන්ඩර් කර විකිණීමේ කටයුතු ආරම්භ කර ඇති අතර දැනට ටෙන්ඩරයට අදාළ පුවත්පත් දැන්වීම් පල කර ඇත. |
| (ආ) සභාව සතු වාහන 239 ක් පැවතියද ට්‍රැක්ටර් 04 ක්, ලොරි රථ 01 ක්, වෑන් රථ 06 ක්, කාර් 02 ක් හා ත්‍රීවිල් 05 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර කුලියට ලබාගත් වාහන 18 සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.13,857,618 ක මුදලක් කුලී වශයෙන් ගෙවා තිබුණි. | උපරිම ඵලදායිතාවයක් ලබාගැනීමට කටයුතු කල යුතු අතර ඇතැම් වාහන වල අවශ්‍යතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුවේ. | සභාවේ එදිනෙදා පැවරෙන කාර්යයන් ඉටුකර ගැනීමේදී ඇතිවන විවිධාකාරයේ අවශ්‍යතාවයන් අනුව වරින් වර එක් එක් දෙපාර්තමේන්තු මඟින් කරන ලද ඉල්ලීම් සලකා බලා සභාවේ වාහන හා රියදුරන් ප්‍රමාණවත් නොවන විට එම රාජකාරි අප්‍රමාදව කාර්යක්ෂමව ඉටු කිරීමට සභාව විසින් කුලී පදනම මත වාහන ලබා ගෙන ඇත. එහිදි කුලී පදනම මත වාහන ලබා ගැනිම වාසිදායක වේ. |

## 3.6 ආර්ථික නොවූ ගනුදෙනු

| | | | |
|---|---|---|---|
| (අ) | වනරතන පාරේ සිට ෆොන්සේකා පාර දක්වා මාර්ගය විවෘත කිරීම සඳහා ඉඩම් අත්පත් කරගැනීම වෙනුවෙන් 2018 පෙබරවාරි මස රු.4,500,000 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කර තිබුණද 2019 මැයි 20 දින වන විටත් ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>ඉඩම් අත්පත් කරගැනීමේදී සමහර පුද්ගලයින්ගේ ඉඩම්වලින් කොටසක් හා නිවාස වල කොටසක් කැඩීමටද වැසිකිළි කැඩීමට ආදී වශයෙන් විශාල අලාභයන් සිදුවීමත් බහුතරයකට දැනට පවතින විකල්ප මාර්ග ප්‍රමාණවත් වීම හා සිදුවන අලාභයන් හා සැලකීමේදී පවුල් 02 කට පමණක් සෘජු ප්‍රවේශයක් ලැබෙන මෙම මාර්ගය ඉදිකිරීම සඳහා දරන වියදම අනාර්ථික විය. | සභා අරමුදල් අවශ්‍ය හා බහුතරයකට ඵලදායි කාර්යයන් සඳහා යෙදවිය යුතුවේ. | සමීක්ෂණයක් සිදුකර පැහැදිලි පිළිතුරක් දීමට බලාපොරොත්තු වේ. |
| (ආ) | සරණංකර ළමා පුස්තකාලයේ ජල බිල්පත් නොගෙවීම නිසා ජල සබඳතාවය විසන්ධි කර තිබූ අතර යළි සම්බන්ධතාවය ලබාගැනීම වෙනුවෙන් රු.3,450 ක අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි. | වගකිවයුතු නිලධාරින්ගෙන් අයකරගැනීමට කටයුතු කල යුතුවේ. | සමීක්ෂණයක් සිදුකර පැහැදිලි පිළිතුරක් දීමට බලාපොරොත්තු වේ. |

## 3.7 හඳුනා ගන්නා ලද පාඩු

| | | | |
|---|---|---|---|
| (අ) | ගබඩා භාරකරු බඩු නිකුත් කිරීමේ නියෝග පත්‍රිකා වෙනස් කිරීම තුළින් සිදුකල අවභාවිතය නිසා සභාවට රු.131,475 ක පාඩුවක් සිදු වී තිබුණි. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මේ සම්බන්ධව මූලික විමර්ශනයක් පවත්වාගෙන යනු ලබන අතර ඒ අනුව සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ආ) | 2011 නොවැම්බර් 11 දින සිට 2016 අප්‍රේල් දක්වා සේවය අත්හිට වූ සේවකයකු වෙනුවෙන් රු.1,413,903 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම මුදල් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබූ බැවින් ඒ සඳහා ගල්කිස්ස ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B/1799/16 යටතේ නඩුවක් පවරා තිබුණි. | මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කල යුතු අතර වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ගේ අවධානය යොමු විය යුතුවේ. | මේ සම්බන්ධයෙන් ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය අංක **B/1799/16** යටතේ නඩුවක් විභාග වෙමින් පවතින අතර නීතිපති උපදෙස් ඉල්ලා යවා ඇති බැවින් නඩුවේ තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එක් එක් පුස්තකාල වලින් පාඨකයින් සඳහා බැහැර ගෙන යාමට ලබා දී තිබූ පොත්වලින් කාලය අවසන් වී දිගුකාලයක් ගත වී තිබූ ආපසු පුස්තකාලය වෙත භාර දී නොතිබුණු පොත් 58 ක් සම්බන්ධයෙන් වටිනාකම අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්නා බව දැනුවත් කර මේ වන විටත් අදාල අයට ලිපි යවා ඇති අතර සාර්ථක ප්‍රතිචාරයක් නොලැබුණහොත් ඇපකරුවන්ගේ වරිපනම් ගාස්තුවට එකතු කර අයකර ගැනීමට උපදෙස් ලබා දී ඇත. |

**3.8 ප්‍රසම්පාදනය**

---------------

**3.8.1 ප්‍රසම්පාදන සැලස්ම**

----------------------

| | | |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා නිසි පරිදි සකස් කර අනුමැතිය ලබාගත් ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබූ අතර 2018 අගෝස්තු මස සිට ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද ඒ සඳහා අනුමැතිය ගෙන නොතිබුණි. | වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කල යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

**3.8.2 සැපයීම් හා සේවා**

--------------------

| | | |
|---|---|---|
| ලැප්ටොප් පරිගණක මිලට ගැනීම සඳහා තෝරාගත් සැපයුම්කරු ඇනවුමෙන් පසු සති 2-4 කින් සැපයීමට එකඟ වී තිබුණද පසුව කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද එකඟ වූ මිල ගණන්වලට සැපයිය නොහැකි බව දන්වා තිබීම හේතුවෙන් දෙවන සැපයුම්කරුගෙන් භාණ්ඩ මිලටගෙන තිබූ අතර පළමු සැපයුම්කරු අසාධු ගතකර නොතිබුණි. | මෙවැනි අවස්ථාවක සැපයුම්කරුවන් අසාධු ගත කල යුතුවේ. | **E – WIS** ආයතනයෙන් පරිගණක කලට වේලාවට සැපයිම අපොහොසත් වීම තුලින් එම ආයතනයට අදාල ඇණවුම් ලබාදීම ප්‍රතික්ෂේප කර **STC** ආයතනයෙන් පරිගණක ලබා ගැනීමට මුදල් කමිටු නිර්දේශ හා සභා අනුමැතියන් අනුව කටයුතු කර තිබුණි. |

**3.8.3 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

| | | | |
|---|---|---|---|
| (අ) | පොදු අරමුදලින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 31 ක ඇස්තමේන්තුගත මුදල ඉක්මවා කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගත වී තිබීම නිසා ඇස්තමේන්තු මුදලට වඩා රු.2,608,128 ක් වැඩි වී තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කල යුතුවේ. | මෙම ව්‍යාපෘති 31 හි කොන්ත්‍රාත්කරුවන් මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ ඇස්තමේන්තු මුදල ඉක්මවා 15% 20% වැනි අගයන් වලිනි. නමුත් සභාවට වාසිදායක වන පරිදි ඇස්තමේන්තු මුදලේ වැඩිවිම 10% ප්‍රමාණය ඉක්මවා |

| | | | |
|---|---|---|---|
| | | | නොයන පරිදි කොන්ත්‍රාත්කරුවන්ගෙන් වට්ටම් ලබාගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | රත්මලාන කොතලාවලපුර දුම්රිය ක්‍රීඩාංගනයේ එළිමහන් කායවර්ධන උපකරණ සපයා සවිකිරීම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී ගිවිසුම්ගත වීම සඳහා කල්පිරීමේ කාලය අවුරුදු 01 ක් වන රු.62,556 ක වටිනාකමකින් යුත් කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කල යුතු බව දක්වා තිබුණද 2018 දෙසැම්බර් 24 දින ගිවිසුම් අත්සන් කිරීමේදී මාස 03 ක වලංගු කාලයක් සහිත කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කර ගිවිසුම්ගත වී තිබුණි. මේ නිසා 2019 මාර්තු 04 වන විට ඇපකරයේ වලංගු කාලය ඉක්මවා තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් වී නොතිබුණි. තවද නඩත්තු කාලය පිළිබඳව ද සැලකිලිමත් වී නොතිබුණි. | ගිවිසුම්ගත කාලය තුල ව්‍යාපෘති ඉටු කල යුතුවේ. | මෙම කොන්ත්‍රාත්තුවට ලබා දී ඇති ඇපකරය අනුව ගිවිසුම් ගත වුවත් කර්මාන්තයට අදාල ගෙවීම් සිදුකිරීමට පෙර ඇපකරයේ කාලය දීර්ඝ කිරීමට කොන්ත්‍රාත්කරු දැනුවත් කරනු ඇත. |
| (ඇ) | සෘජු ශ්‍රම පදනම යටතේ මාර්ගවල තාර ආලේප කිරීමේදී ව්‍යාපෘති 03 ක නියමිත ප්‍රමිතයන්ට අනුව සිදුකර නොතිබීම නිසා නිමවුමේ ඵලදායීතාවය අඩු වී තිබුණි. | නියමිත ප්‍රමිතයන්ට අනුව ව්‍යාපෘති ඉටු කල යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 18 ක් සඳහා 2019 මැයි 24 දින වන විටත් පිළිතුරු / කරුණු පැහැදිලි කර නොතිබුණි. | අදාල කාලසීමාව තුල පිළිතුරු ඉදිරිපත් කල යුතුවේ. | පිළිතුරු 07 ක් විගණනයට ඉදිරිපත් කර ඇත. 04 ක පිළිතුරු කෙටුම්පත් සකස් කර ඇති අතර 03 ක පිළිතුරු කෙටුම්පත් සකස් කරමින් පවතී. අනෙක් 04 ක විගණන විමසුම් අප වෙත ලැබී ඇත්තේ අප්‍රේල් මස අවසානයේ සහ මැයි මස මුලදීය. |